සියලුම හිමිකම් ඇවිරිණි
All Righis Reserved

# කැලණිය අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය 2016

### 11 ශ්‍රේණිය

### බුද්ධ ධර්මය I

නම/විෂය අංකය ---------------------------------------------------------------------------------------------------කාලය පැය 1

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

එක් නිවැරදි පිළිතුරකට ලකුණු එකකි. ( 1×40 = 40)

01. සියලු යස ඉසුරු මැද දිවි ගෙවූ සිදුහත් කුමරු තමා අත්විඳින ජීවිතය ජීවිතයේ යථාර්ථය නොවන බව තේරුම් ගත්තේ,

(i) උයන් කෙළියට යාමෙනි (ii) ඡන්න සමඟ කළ කතාවෙනි
(iii) මළ කඳක් දැකීමෙනි (iv) විමසිලිමත් බවෙනි

02. සංසාරගත දුකින් මිදී නිවන් පසක් කරගනු පිණිස මිනිසාට මග පෙන්වනු ලබන මහා සංඝ රත්නය හෙවත් භික්ෂු සමාජයේ ආරම්භය සිදු වන්නේ,

(i) ප්‍රථම රහත් හැට නමගේ ධර්ම ප්‍රචාරයෙනි
(i) ප්‍රථම ධර්ම සංගායනාවෙනි
(i) පස්වග තවුසන් මහණ වීමෙනි
(i) මිහිඳු මාහිමියන් ලක් දිවට වැඩම වීමෙනි

03. "අරහං" බුදුගුණයට ඇතුළත් නොවන බුදු ගුණයක් වන්නේ,

(i) පුද පූජා ලැබීමට සුදුසු වීම (ii) රහසින්වත් පව් නොකිරීම
(iii) දෙව්මිනිසුන්ට ශාස්තෘවීම (iv) සියලු කෙලෙස් දුරු කිරීම

04. ඇසුරු කිරීම සඳහා සුදුසු කල්‍යාණ මිත්‍රයෙකු තෝරා ගැනීමේ දී වඩාත් සැලකිලිමත් විය යුත්තේ, එම පුද්ගලයාගේ,

(i) වයස පිළිබඳවය (ii) ගතිගුණ පිළිබඳවය
(iii) ධනවත්කම පිළිබඳවය (iv) රැකියාව පිළිබඳවය

05. සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව හා සමානාත්මතාවය හඳුන්වන්නේ,

(i) සතර කර්ම ක්ලේශ නමිනි (ii) සතර අගති නමිනි

(iii) සතර බ්‍රහ්ම විහරණ නමිනි (iv) සතර සංග්‍රහ වස්තු නමිනි

06. පසේ බුදු බව ප්‍රාර්ථනා කරන බෝධිසත්වයන් වහන්සේලා පුරනු ලබන පාරමිතා විසි වැදෑරුම් වේ. ඒවා අයත් වන කොටස් දෙක වන්නේ,

(i) පාරමී - උප පාරමී ය (ii) පරමත්ථ පාරමී - පාරමී ය

(iii) උප පාරමී - පරමත්ථ පාරමී ය (iv) පාරමී - දස පාරමී ය

07. වචනයෙන් සිදුවන වැරදි අතුරින් එකක් "පිසුනාවාචා" යනුවෙන් හඳුන්වයි. ඉන් වැළකෙන තැනැත්තා විසින් කළ යුත්තේ,

(i) සත්‍ය වචන කථා කිරීමයි

(ii) මිනිසුන්ගේ සමඟියට තුඩුදෙන පරදි කතා කිරීමයි

(iii) මටසිලිටි මිහිරි වචන කතා කිරීමයි

(iv) අර්ථවත් වූ දැහැමි වචන කතා කිරීමයි

08. බෞද්ධ ජීවිතයක් හොඳින් ගත කරන ආකාරය විස්තර කෙරෙන "බෞද්ධයාගේ අත්පොත" නම් ග්‍රන්ථයේ කතුවරයා වන්නේ,

(i) ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමා ය

(ii) රේරුකානේ චන්ද්‍රවිමල මහනාහිමිය ය

(iii) දෙවන පරාක්‍රමබාහු රජතුමා ය

(iv) වීදාගම මෛත්‍රේය මහනාහිමි ය

09. සිත කිලිටි කරන, කුසල් සිත්වලට බාධා කරන සිතිවිලි "පංච නීවරණ" නමින් හැඳින්වේ. ඒවා අතුරින් "ථීන මිද්ධ" නමින් හඳුන්වන්නේ,

(i) සිතෙහි හා කයෙහි ඇති වන උදාසීන බවයි

(ii) විවිධ කරුණු පිළිබඳ සිතෙහි ඇතිවන සැකයයි

(iii) කාම වස්තු කෙරෙහි ඇති වන ආශාවයි

(iv) සිතෙහි ඇති වන නොසන්සුන්කම හා පසුතැවිල්ලය

10. සසර දුක බුදු දහමේ තුන් ආකාරයකින් දක්වා ඇත එහි "විපරිණාම දුක්ඛතා" යනුවෙන් දක්වන්නේ,

(i) සාමාන්‍ය දුකය

(ii) අසාමාන්‍ය දුකය

(iii) වෙනස් වීමේ දුකය

(iv) ඇතිවීම් නැතිවීම් හේතුවෙන් හට ගන්නා දුකය

18. අලුවිහාර සංගායනාව හෙවත් සිව්වන ථේරවාදී සංගායනාව පවත්වන ලද්දේ,

(i) රජගහ නුවර සප්ත පර්ණි ගුහාද්වරයේදීය

(ii) මාතලේ ආලෝක විහාරයේදීය

(iii) පැළලුප් නුවර අශෝකාරාමයේදීය

(iv) විශාලා මහ නුවර කූටාගාර ශාලාවේදීය

19. තුන් දොරින් සිදුවන අකුසල ක්‍රියාවන් ගැන ඉගැන්වීමේ දී මනසින් සිදුකරන අකුසලයක් වන්නේ,

(i) අදත්තාදානය (ii) සම්පපලාපය

(iii) අභිධ්‍යාවය (iv) පිසුනාවාචාය

20. මංගල සූත්‍රයේ ඇතුළත් මංගල කරුණු ගණන,

(i) 38 කි (ii) 32 කි

(iii) 40 කි (iv) 28 කි

21. අනුරාධපුර බිසෝ මාළිගාවෙන් හමුවන සුප්‍රසිද්ධ ශ්‍රේෂ්ඨ කලා නිර්මාණයක් වන්නේ,

(i) දොරටුපාල රූපයයි (ii) බෝධිසරයයි

(iii) වාහල්කඩයි (iv) සඳකඩ පහණයි

22. බුදුරජාණන් වහන්සේ ද විවිධ දුෂ්කර සිදුවීම්වලට මුහුණ දුන් අවස්ථාවකට නිදසුනක් වන්නේ,

(i) ප්‍රථම ධර්ම දේශනාවයි

(ii) වේරංජාවේ වස් විසූ කාලයයි

(iii) අංගුලිමාල දමනයයි

(iv) සත්සතිය ගත කිරීමයි

23. ගර්භයේ ස්වරූපය අනුව ප්‍රධාන වශයෙන් ස්තූප සයකාර වේ. ඒ අනුව "අමලාකාකාර ස්තූප" යනුවෙන් හඳුන්වනේ,

(i) දිය බුබුලක හැඩයගත් ස්තූප ය.

(ii) කළයක හැඩයගත් ස්තූප ය

(iii) නෙළුම් මලක හැඩයගත් ස්තූප ය

(iv) නෙල්ලි ගෙඩියක හැඩයගත් ස්තූප ය

11. ශක්තිමත් බල සම්පන්න කුසල අකුසල කර්ම විපාක දෙන ආකාරය අනුව අයත් වන්නේ,

(i) ගරුක කර්මයට ය (ii) ආසන්න කර්මයට ය

(iii) ආචිණ්ණ කර්මයට ය (iv) අහෝසි කර්මයට ය

12. චුල්ලකම්ම විභංග සූත්‍රයට අනුව ද්වේශයෙන් කටයුතු කරන පුද්ගලයාට ලැබෙන කර්ම විපාකය වන්නේ,

(i) දුප්පත්ව ඉපදීමය (ii) ප්‍රඥාව අනුව ඉපදීමය

(iii) ආබාධ සහිතව ඉපදීමය (iv) විරූපිව ඉපදීමය

13. සප්ත අපරිහානි ධර්ම අනුගමනය කරන ලද්දේ,

(i) කොසොල් රජතුමා විසිනි (ii) බිම්බිසාර රජතුමා විසිනි

(iii) ශාක්‍ය රජ දරුවන් විසිනි (iv) වජ්ජි රජදරුවන් විසිනි

14. මහින්දා ගමනයෙන් පසු මෙරට බුදු දහම ස්ථාපිත වීමත් සමඟ ගොඩනැගුණු ප්‍රථම චෛත්‍ය වන්නේ,

(i) සෝමාවතී චෛත්‍යය යි (ii) ථූපාරාම චෛත්‍යය යි

(iii) මහියංගන චෛත්‍යය යි (iv) රුවන්වැලි මහා චෛත්‍යය

15. සසර දුකින් එතෙර වීමට බුදුරජාණන් වහන්සේ වදාළ මගට පිවිසීමේ දොරටුව වන්නේ,

(i) තෘෂ්ණාව නැති කිරීමයි (ii) භාවනා කිරීමයි

(iii) ශ්‍රද්ධාවයි (iv) සිල් රැකීමයි

16. ''අනිච්චාවත සංඛාරා උප්පාද වයධම්මිනෝ '' යන ගාථා පාඨයෙන් උගන්වනු ලබන්නේ,

(i) ආත්මය පිළිබඳවය (ii) නිත්‍ය ලක්ෂණ පිළිබඳවය

(iii) අනාත්මය පිළිබඳවය (iv) අනිත්‍ය ලක්ෂණ පිළිබඳවය

17. ''ඔබ වහන්සේ පැවිදි වුයේ කවරෙකු උදෙසා ද? ඔබ වහන්සේගේ ගුරුතුමා කවරෙක් ද? කාගේ දහමක් ඔබ වහන්සේ රුචි කරන්නේ ද? ''අස්සජි මහරහතන් වහන්සේගෙන් මෙසේ අසන ලද්දේ,

(i) උපතිස්ස පිරිවැජියා ය (ii) සංජය පිරිවැජියා ය

(iii) කෝලිත පිරිවැජියා ය (iv) ද්‍රෝණ බමුණාය

37. බුදුරජාණන් වහන්සේ විසින් භික්ෂූන් වහන්සේලාට තනතුරු ප්‍රදානය කිරීමේ දී ප්‍රධාන වශයෙන් බලන ලද්දේ තනතුරු ලාභියාගේ ,

(i) කුලය යි (ii) කුසලතාවය යි

(iii) බලය යි (iv) නිලය යි

38. අප බෝසතාණන් වහන්සේ සත්‍ය පාරමිතාව පිරූ ආකාරය හෙළිවන ජාතක කතාවක් වන්නේ,

(i) වට්ටක ජාතකය යි (ii) තේමිය ජාතකය යි

(iii) වණ්ණුපථ ජාතකය යි (iv) ලෝමහංස ජාතකය

39. ලෝකය මෙන්ම සත්ත්වයා ද සකස් වී ඇත්තේ ස්කන්ධ පහකින් බව බුදුදහමේ ඉගැන්වේ. ඊට අනුව සංඛාර ස්කන්ධය යනු,

(i) සිත් තුළ උපදින සටහන් නිමිති හඳුනා ගැනීම ය

(ii) රූප ශබ්දාදී අරමුණු හමු වූ විට සිතෙහි ඇතිවන වින්දනය යි

(iii) චේතනාව පෙරටු කරගත් ක්‍රියාවන් ය

(iv) අරමුණු ගැනීමත් සමඟ පහළවන දැනීම යි

40. රාජ්‍ය පාලකයෙකුට යුක්තිය, අයුක්තිය, හොඳ, නරක තෝරා බේරා ගැනීමට නොහැකිවන්නේ,

(i) ඡන්දය නිසා ය (ii) ද්වේශය නිසා ය

(iii) මෝහය නිසා ය (iv) භය නිසා ය

31. නිත්‍ය වූ ආත්මයක් හෙවත් මම යනුවෙන් කෙනෙකු ඇතැයි යන පිළිගැනීම බැහැර කරනු ලබන්නේ,

(i) මහා බ්‍රහ්මයා පිළිබඳ ඉගැන්වීමෙනි

(ii) හේතුඵල දහම පිළිබඳ ඉගැන්වීමෙනි

(iii) සර්ව බලධාරී දෙවියන් පිළිබඳ ඉගැන්වීමෙනි

(iv) සියල්ල පෙර කර්මයට අනුව සිදුවන බව ඉගැන්වීමෙනි

32. විවිධ ජාතින් විවිධ ආගමිකයන් අතර සමගිය සහජීවනය ඇති කරවන බෞද්ධ ඉගැන්වීමක් වන්නේ,

(i) සතර සංග්‍රහ වස්තුවයි (ii) සතර අගතියයි

(iii) සතර සෘද්ධිපාදයයි (iv) සතර කර්මක්ලේශයයි

33. උපතේ පටන් ජීවිත කාලය පුරා අප මුහුණ දෙන දුක්දොම්නස්වල ස්වභාවය හඳුනාගත් අප විසින් ඉන් මිදීම සඳහා අනුගමනය කළ යුතු වන්නේ,

(i) දුක්ඛ ආර්ය සතයයි

(ii) දුක්ඛ සමුදය ආර්ය සතයයි

(iii) දුක්ඛ නිරෝධ ආර්‍ය සතයයි

(iv) දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සතයයි

34. දුටුගැමුණු රජතුමා විසින් බුදුසසුනේ උන්නතිය උදෙසා කරවන ලද බෞද්ධ ස්තූප වන්නේ,

(i) අභයගිරිය හා ලංකාරාමයයි

(ii) ජේතවනාරාමය හා ථූපාරාමයයි

(iii) රුවන්වැලි සෑය හා මිරිසවැටියයි

(iv) රුවන්වැලි සෑය හා සේල චෛත්‍යයයි

35. ''උට්ඨානවතෝ සතිමතෝ - සුචිකම්මස්ස නිසම්මකාරිනෝ'' මෙම ගාථා පාඨයේ පුද්ගල ජීවිතයේ සාර්ථකත්වයට හේතුවන කරුණු 4ක් ඉගැන්වේ. එහි ''සුචිකම්මස්ස'' යන්නෙහි අදහස වන්නේ,

(i) සිතාමතා කටයුතු කිරීම

(ii) තිදොරින් නිදොස් ක්‍රියා කිරීමයි

(iii) නොපසුබස්නා වීර්ය

(iv) යහපත් කල්පනාවෙන් යුක්ත වීම

36. සිගාලෝවාද සූත්‍රයේ ඉගැන්වෙන සදිසා නමස්කාරය අනුව උතුරු දිසාවට අයත් කාණ්ඩායම වන්නේ,

(i) ගුරුවරුන් ය (ii) අඹුසැමියන් ය

(iii) හිතමිතුරන් ය (iv) ස්වාමි සේවකයින්ය

24. අනුලෝම පටිච්ච සමුප්පාදයට අනුව දුක් ඇතිවන ආකාරය දැක්වීමේ දී ''තණ්හාව'' ඇති වීමට ප්‍රත්‍ය වන්නේ,

(i) වේදනාවයි (ii) නාම රූපයි

(iii) සංඛාරයයි (iv) ව්‍යාධියයි

25. ''ජාත රූප රජත පටිග්ගහණා වේරමණී සික්ඛා පදං සමාදියාමි'' මෙම සිල්පදය ඇතුළත් වන්නේ,

(i) ආජීව අෂ්ටමකසීලයෙහිය (ii) උපෝසථ සීලයෙහිය

(iii) දස සීලයෙහිය (iv) පංච සීලයෙහිය

26. කුසල ධර්ම දියුණු කරන මානසික අභ්‍යාසය වන්නේ,

(i) දානයයි (ii) සීලයයි

(iii) භාවනාවයි (iv) පරිත්‍යාගයයි

27. ''ආරක්ඛ සම්පදා '' යනු ධාර්මිකව උපයාගත් ධනය විනාශ වීමට ඉඩ නොදී එය මැනවින් ආරක්ෂා කර ගැනීමයි. මෙම ඉගැන්වීම ඇතුළත් වන්නේ,

(i) මංගල සූත්‍රයෙහි ය (ii) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි ය

(iii) පරාභව සූත්‍රයෙහි ය (iv) වසල සූත්‍රයෙහි ය

28. ලොව පවත්නා බලවත්ම රෝගය ලෙස බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද්දේ,

(i) නින්ද නොයෑමයි (ii) මානසික රෝගයයි

(iii) කුසගින්නයි (iv) තුන්දොස් කිපීමයි

29. යම් කරුණක් එකහෙලා නොපිළිගත යුතු අයුරු කරුණු 10 ක් යටතේ පැහැදිලි කරමින් සිතා විමසා බලා යමක් පිළිගත යුතු ආකාරය දැක්වෙන් බුද්ධ දේශනාව ඇතුළත් සූත්‍රය වන්නේ,

(i) කාලාම සූත්‍රයයි (ii) මංගල සූත්‍රයයි

(iii) පරාභව සූත්‍රයයි (iv) වසල සූත්‍රයයි

30. පුද්ගලයා විසින් සිතින් සිතා කර්ම රැස් කරනු ලබන්නේ

(i) වචනයෙණි (ii) කයෙනි

(iii) මනසෙනි (iv) තුන්දොරිනි

සියලුම හිමිකම් ඇවිරිණි
All Righis Reserved

# කැලණිය අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය2016

### 11 ශ්‍රේණිය

### බුද්ධ ධර්මය II

නම/විෂය අංකය ---------------------------------------------------------------------------------------------------කාලය පැය 2

පළමු ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

01. 1. බුදුවීම සඳහා තමන් වහන්සේට සෙවණ ලබා දුන් බෝධීන් වහන්සේ වෙනුවෙන් "අනිමිසලෝචන පූජාව" පැවැත්වීමෙන් ලොවට ලබා දුන් ආදර්ශය කුමක්ද?
2. බුදුරජාණන් වහන්සේ තුළ පැවති "තාදි ගුණයෙන්" අදහස් කරන්නේ කවර ගුණයක්ද?
3. මෙතෙක් හමුවී ඇති කලාත්මක බවෙන් උසස්ම බෝධිඝරය පිහිටා ඇති ස්ථානය නම් කරන්න
4. ''සමජීවිකතා'' යන්නෙහි අදහස ලියන්න
5. දුක්ඛ ආර්ය සත්‍යයෙහි ප්‍රභේදවලින් හතරක් ලියන්න
6 ''මම සම්බුද්ධ වෙමි, ශ්‍රේෂ්ඨතම ශල්‍ය වෛද්‍යවරයා ද වෙමි.'' බුදුරජාණන් වහන්සේගේ මෙම ප්‍රකාශයට අනුව උන් වහන්සේ වෙදකම් කළේ කුමන රෝගයකටද?
7. අනගාරික ධර්මපාලතුමා පැවිදි බවට පත්වීමෙන් පසු හැඳින් වූයේ කවර නමකින්ද?
8. ''ආචිණ්ණ කර්ම'' යන්න හඳුන්වන්න
9. කනිෂ්ක ධර්ම සංගායනාව හෙවත් සර්වාස්තිවාදි සංගායනාවේ ප්‍රධානත්වය දැරූ තෙරුන් වහන්සේ නම් කරන්න
10. සමථ භාවනාව සඳහා යොදාගත හැකි කර්මස්ථාන ගණනින් කීයද?

02. 1. බුදුරජාණන් වහන්සේ තුළ පැවති අසීමිත ගුණ සමුදායෙන් ඔබ ඉගෙන ගත් ගුණ දෙකක් නම් කරන්න
2. ඔබ විසින් නම් කරන ලද ගුණ දෙකෙන් එකක් කෙටියෙන් පැහැදිලි කර නිදසුනක් සපයන්න
3. මෙලොව ජීවත් වන සියලු දෙනාටම අටලෝදහමට මුහුණ දීමට සිදුවේ. බුදු සිරිත ඇසුරෙන් ඔබ අටලෝ දහමට මුහුණ දෙන අයුරු විස්තර කරන්න

03. 1. පාරමිතා හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න

2. පාරමිතාවක් සම්පූර්ණ වීමට කරුණු පහක් අවශ්‍ය වේ. ඉන් අත් හැරිය යුතු කරුණු තුන ලියා දක්වන්න

3. දස පාරමිතා ධර්ම සමාජ ජීවිතයට වැදගත් වන අයුරු පැහැදිලි කරන්න

04. 1. බෞද්ධ භාවනාව දෙයාකාරයි. එම ප්‍රභේද දෙක නම් කරන්න

2. බුදු දහමේ භාවනාව නමින් හැඳින්වෙන්නේ කුසල ධර්ම දියුණු කරන මානසික අභ්‍යාසයක් බවයි. එහිදි කුසල යන්නෙහි අදහස් තුනක් දක්වා ඇත.ඒවා ලියා දක්වන්න

3. භාවනාව මගින් ලෞකික මෙන්ම ලෝකෝත්තර ප්‍රතිඵල ද ලබා ගත හැකි අයුරු පැහැදිලි කරන්න.

05. 1. තමන් කරන ක්‍රියාවල විපාකය ප්‍රීතියෙන් හා සොම්නසින් යුතුව විදිය හැකි බව කියවෙන ධම්ම පද ගාථාව ලියන්න

2. එම ගාථාවේ සරල අදහස ලියන්න.

3. ධම්ම පද ගාථාවලින් පෙන්වා දෙන උපදේශ සිසුන් වශයෙන් ප්‍රායෝගික ජීවිතයට යොදා ගෙන ජීවිතය සාර්ථක කර ගන්නා අයුරු විස්තර කරන්න

06. 1. බුදුරජාණන් වහන්සේ කක්කරපත්ත නැමැති කෝලිය ගමට වැඩ දීඝජාණු කෝලිය පුත්‍රයාට දේශනා කළ සූත්‍රය කුමක්ද?

2. එම සූත්‍රයේ සඳහන් පුද්ගලයාගේ මෙලොව හිත සුව පිණිස පවත්නා කරුණු හතරෙන් තුනක් ලියන්න

3. දීඝජාණු කෝලිය පුත්‍රයාට දේශනා කළ සූත්‍රයේ ඇතුළත් කරුණු අනුව මෙලොව ජීවිතය සැපවත් කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න

07. පහත සඳහන් මාතෘකාවලින් දෙකක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න

1. අභියෝග ජය ගැනීම

2. නීවරණ ධර්ම

3. අතිපූජ්‍ය රේරුකානේ චන්ද විමල මාහිමිපාණන් වහන්සේ

4. බෞද්ධ හේතුඵල දහම